සියලු ම හිමිකම් ඇවිරිණි All Rights Reserved

NEW

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2022
ආදර්ශ ප්‍රශ්න පත්‍රය
General certificate of Education (Adv. Level) Examination 2022
Modal Paper

ආර්ථික විද්‍යාව II
Economics II

21 S II

පැය තුනයි
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
Additional Reading Time - 10 Minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස් :

* *'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.*
* *ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.*

'අ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න)

1)

I. අවශ්‍යතා යනු මිනිසෙකු වශයෙන් ජීවත්වීමට පුද්ගලයෙකුට අවශ්‍ය අවම දෑ වේ. ජීවත්වීම සඳහා සපුරාගත යුතු අවම දෑ ඇත්තේ සීමිත ප්‍රමාණයකි.

උදා:- ජලය, ආහාර, වස්ත්‍ර, වාසස්ථාන

උවමනා යනු, අවශ්‍යතා සපුරා ගැනීමට හා තෘප්තිය වැඩි කරගැනීමට මිනිසා විසින් තෝරාගනු ලබන විවිධ ආකාර ස්වරූප හා ක්‍රම වේ. නැතහොත් භාණ්ඩ හා සේවා පරිභෝජනය කිරීමට මිනිසා තුළ ඇති අසීමිත කැමැත්ත වේ.

උදා:- ආහාර මිනිස් අවශ්‍යතාවක් වන අතර එය බත්, පාන්, ආප්ප වැනි විවිධ ආහාරවලින් සපුරාගත හැකිය.

මිනිස් අවශ්‍යතා සීමාසහිත වන නමුදු මිනිස් උවමනා අසීමිත වේ. සීමිත අවශ්‍යතාවන් සපුරා ගතහැකි විවිධ ආකාර අසීමිත උවමනා මගින් පිළිබිඹු වේ.

II. හිඟකම යනු, අසීමිත මිනිස් උවමනාවලට සාපේක්ෂව සමාජය සතු සම්පත් සම්භාරය ප්‍රමාණවත් නොවන බවයි. මෙය සෑම සමාජයකටම පොදු මූලික ආර්ථික ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය පැන නගින්නේ යම් දෙන ලද අවස්ථාවක මිනිස් උවමනාවන් අසීමිත වීම හා සම්පත් ප්‍රමාණය සීමිත වීම නිසයි.

තේරීම යනු, කිසියම් දෙන ලද අවස්ථාවක මිනිස් උවමනා සපුරා ගැනීමට ඇති සම්පත් ප්‍රමාණය සීමිත බැවින් එම සීමිත සම්පත් යොදා ගනිමින් කවර උවමනා ඉටු කරන්නේ දැයි තීරණය කිරීමයි. සමාජය සතු සම්පත්වල ඇති ප්‍රධාන ලක්ෂණය වන්නේ ඒවා සතුව විකල්ප භාවිත තිබීමයි. මේ නිසා තේරීම පිළිබඳ ප්‍රශ්නය ඉතා වැදගත් ආකාරයෙන් ඉස්මතු වේ.

ආවස්ථික පිරිවැය යනු, නිෂ්පාදනය හා පරිභෝජනය පිළිබඳ විකල්ප තේරීම් හමුවේ කිසියම් තේරීමක් කරන විට, ඒ වෙනුවෙන් කැප කිරීමට සිදුවන ඊළඟ හොඳම විකල්පයේ වටිනාකම වේ.

සමාජය සතු සම්පත් හිඟවීම හා සම්පත්වල විකල්ප ප්‍රයෝජනවලින් යුක්ත වීම නිසා සෑම සමාජයකටම තේරීම් කිරීමට සිදුවේ. තේරීම සමඟම ආවස්ථික පිරිවැයක් ඇති වේ.

හිඟකමක් නොමැති විට තේරීමක් නොමැත. තේරීමක් නොමැති විට ආවස්ථික පිරිවැයක් නොමැත.

III. ශ්‍රමය යනු, භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට යොදාගත හැකි සියලුම කායික හා මානසික ප්‍රයත්න වේ. ශ්‍රමය මනින්නේ ශ්‍රම කාලය මගිනි.

භාණ්ඩයක් හෝ සේවාවක් නිපදවීමට භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය වැනි නිෂ්පාදන සාධක සංවල කරමින් නිෂ්පාදන ක්‍රියාවලිය සංවිධානය කරන සුවිශේෂී මානව සම්පත ව්‍යවසායකත්වය යි.

ව්‍යවසායකයා නිෂ්පාදන ක්‍රියාවලිය සංවිධානය කරයි. ශ්‍රමිකයා එසේ නොකරයි. ව්‍යවසායකයා අවදානම් දරයි. ශ්‍රමිකයා අවදානම් නොදරයි. ව්‍යවසායකයා නවෝත්පාදන බිහි කරයි. ශ්‍රමිකයා නවෝත්පාදන බිහි නොකරයි. ව්‍යවසායකයා ප්‍රතිපත්තිමය තීරණ ගනියි. ශ්‍රමිකයා ප්‍රතිපත්තිමය තීරණ නොගනී. ව්‍යවසායකයා ලාභ හෝ පාඩු ලබයි. ශ්‍රමිකයා වැටුප් ලබයි.

IV.

බඩඉරිඟු	රෙදි
15	0
12	1
7	2
0	3



Sabaragamuwa University of Sri Lanka

d) සම්පත් සම්භාරය ඉහළ නංවා ගැනීම (උදා :- නව ස්වභාවික සම්පත් ගවේෂණය), සාධක ඵලදායීතාව වර්ධනය වීම (උදා :- පුහුණු ශ්‍රමය භාවිතය වැඩි වීම), තාක්ෂණය දියුණු වීම.

e) විදේශ වෙළඳාමේ හුවමාරුවේ වාසි ලබා ගැනීම, ආර්ථික වෘද්ධි ක්‍රියාවලියක් හට ගැනීම, විදේශ ආධාර ලබා ගැනීම

f) මෙම තත්ත්වය නි.හැ.මා වක්‍රයට වම්පස (C) ලක්ෂ්‍යකින් දැක්වේ.

V. වෙළෙඳපොළ ආර්ථිකයක් කුමක්, කොපමණ, කෙසේ, කා සඳහා නිපදවන්නේ ද යන මූලික ආර්ථික ප්‍රශ්න, මිල යාන්ත්‍රණය මගින් විසඳයි.

– කුමක් නිපදවිය යුතු ද? - වඩාත් ලාභදායී භාණ්ඩ නිපදවිය යුතුය.

වෙළෙඳපොළ ආර්ථිකයක භාණ්ඩ හා සේවා නිපදවන්නේ ලාභය පදනම් කරගෙන ය. සාපේක්ෂ මිල වැඩි භාණ්ඩයේ සාපේක්ෂ ලාභය වැඩි බැවින් නිමැවුම වැඩි කරයි. සාපේක්ෂ මිල අඩු නම් සාපේක්ෂ ලාභය අඩු බැවින් නිමැවුම අඩු කරයි. මිලක් අය කරගත නොහැකි භාණ්ඩ නිෂ්පාදනය නොකරයි.

– කෙසේ නිෂ්පාදනය කරනු ලැබේ ද? පිරිවැය අවම වන සේ නිෂ්පාදනය කරයි.

වෙළෙඳපොළ ආර්ථිකයක නිෂ්පාදකයන් ආර්ථික වශයෙන් වඩාත් කාර්යක්ෂම නිෂ්පාදන ශිල්පක්‍රමය භාවිත කරයි. ආර්ථික වශයෙන් කාර්යක්ෂම ශිල්පක්‍රම කවරේදැයි තීරණය වනුයේ, පවත්නා තාක්ෂණය හා භාවිත කරනු ලබන සාධකවල මිල ගණන් මතය. මෙලෙස කාර්යක්ෂම ශිල්පක්‍රම තෝරා ගැනීමට මිල යාන්ත්‍රණය මඟ පෙන්වයි. ලාභය උපරිම කර ගැනීමට උත්සාහ කරන නිෂ්පාදකයන් විසින් පිරිවැය අවම කර ගැනීමට මිල අඩු සාධකය වැඩියෙන් ද , මිල වැඩි සාධකය අඩුවෙන් ද යොදා ගනී.

උදා:- ශ්‍රමයේ මිල සාපේක්ෂව අඩු නම් - ශ්‍රම සූක්ෂම ශිල්පක්‍රමය
ශ්‍රමයේ මිල සාපේක්ෂව වැඩි නම් - ප්‍රාග්ධන සූක්ෂම ශිල්පක්‍රමය

– කා සඳහා නිපදවනු ලැබේ ද? ක්‍රය ශක්තියක් ඇති අය සඳහා නිපදවනු ලබයි.

වෙළෙඳපොළ ආර්ථිකයක ආදායම් බෙදී යාම තීරණය වන්නේ සාධක වෙළෙඳපොළ මිල ගණන් හා සාධක සැපයුම් මතය. සෑම සාධකයකම මිල ඒවායේ ඉල්ලුම හා සැපයුම මත තීරණය වේ. සාධක හිමියන් උපයන ආදායම ද තීරණය වනුයේ සාධක මිල මතය.

උදා:- ඉහළ ආදායම් උපයන්නන් වෙනුවෙන් වැඩි භාණ්ඩ හා සේවා ප්‍රමාණයක් ද, සාපේක්ෂව පහළ ආදායම් උපයන්නන් වෙනුවෙන් අඩු භාණ්ඩ හා සේවා ප්‍රමාණයක් ද නිපදවයි.

2)

I.

සිදුවීම්	සැපයුම් වක්‍රයට වන බලපෑම	හේතුව
වතු කම්කරුවන්ගේ දෛනික වැටුප් ඉහළ යාම	වක්‍රය වමට විතැන් වේ	යෙදවුම් මිල ඉහළ යාම
කෝපි මිල ඉහළ යාම නිසා තේ වගාබිම් විශාල සංඛ්‍යාවක් කෝපි වගාවට යොදා ගැනීම	වක්‍රය වමට විතැන් වේ	නිෂ්පාදන ආදේශකවල මිල වැඩිවීම
රජය තේ වගාව සඳහා පොහොර සහනාධාර ලබාදීම	වක්‍රය දකුණට විතැන් වේ	සහනාධාර හේතුවෙන් යෙදවුම් මිල අඩුවීම

II. මිල නම්‍යතාව මනිනු ලබන්නේ ($\frac{\Delta Q}{\Delta P} * \frac{P}{Q}$) මගිනි. මෙහි $\frac{\Delta Q}{\Delta P}$ ඉල්ලුම් වක්‍රයේ බෑවුමයි. ඉල්ලුම් වක්‍රය සරල රේඛාවක් නිසා එය සෑම ස්ථානයකදීම ස්ථාවරය. ඉල්ලුම් වක්‍රය දිගේ ඉහළ සිට පහළට (වමේ සිට දකුණට) ගමන් කරන විට මිල අඩු වෙයි, ප්‍රමාණය වැඩි වේ. එබැවින් $\frac{P}{Q}$ ක්‍රමයෙන් අඩු වේ. ක්‍රමයෙන් අඩුවන $\frac{P}{Q}$ හි අගයෙන්, ස්ථාවරව පවතින $\frac{\Delta Q}{\Delta P}$ හි අගය ගුණ කිරීමෙන් ලැබෙන නම්‍යතා අගය ද ක්‍රමයෙන් අඩු වේ. එබැවින් ඉල්ලුම් නම්‍යතාව අපිරිමිතයේ සිට ශුන්‍ය දක්වා විහිදේ.

Sabaragamuwa University of Sri Lanka

III. මිල වෙනස්වීමක ආදේශන ප්‍රතිවිපාකය

මිල වෙනස්වීමක ආදායම් ප්‍රතිවිපාකය

මිල වෙනස්වීමක ආදේශන ප්‍රතිවිපාකය : ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල පමණක් වෙනස් වීම නිසා සිදුවන සාපේක්ෂ මිල වෙනස කෙරෙහි පාරිභෝගිකයා දක්වන ප්‍රතිචාරයයි.

උදා : මිල වැඩිවීමක ආදේශන ප්‍රතිවිපාකය

බටර් මිල ඉහළ යාම(සලකා බලන භාණ්ඩය) ⟶ බටර් සාපේක්ෂ මිල ඉහළ යාම ⟶ පාරිභෝගිකයන් මාගරින් (ආදේශන භාණ්ඩය) පරිභෝජනයට නැඹුරු වේ. ⟶ බටර් ඉල්ලුම් ප්‍රමාණය අඩු වේ.

මිල වෙනස්වීමක ආදායම් ප්‍රතිවිපාකය : මුදල් ආදායම ඇතුළුව අනෙකුත් කරුණු නොවෙනස්ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල පමණක් වෙනස් වූ විට, පාරිභෝගිකයන්ගේ මූර්ත ආදායම වෙනස්වීම නිසා අදාළ භාණ්ඩයෙන් ඉල්ලුම් කරන ප්‍රමාණයට වන බලපෑමයි.

උදා : මිල වැඩිවීමක ආදායම් ප්‍රතිවිපාකය

කිරිපිටි සාමාන්‍ය භාණ්ඩයක් වන අවස්ථාවක කිරිපිටි මිල වැඩිවීම (අනෙකුත් සාධක ස්ථාවර වේ) ⟶ මූර්ත ආදායම අඩු වේ. ⟶ කිරිපිටි ඉල්ලුම් ප්‍රමාණය අඩු වේ.

IV. සාධක සංචලන හැකියාව.
භාණ්ඩයේ ස්වභාවය.
තොග පවත්වා ගෙන යාමේ හැකියාව.
මිල වෙනස්වීම හේතුවෙන් සැපයුම වෙනස් කිරීමට ගතවන කාලය.

V.

a)



සමතුලිත මිල = රු 60.00

සමතුලිත ප්‍රමාණය = ඒකක 200

Sabaragamuwa University of Sri Lanka

b) අධි ඉල්ලුම = Qd – Qs

300 - 100

<u>200</u>

c) කළු කඩ මිල පරාසය = රු 40 .00 - රු 80.00

d) උපරිම මිලට පෙර පාරිභෝගික අතිරික්තය = $\frac{1}{2} * 40 * 200 = 4000$

උපරිම මිලට පසු පාරිභෝගික අතිරික්තය = $\frac{1}{2} * 100 * 100 = 5000$

පාරිභෝගික අතිරික්ත වෙනස් වීම = 5000 – 4000

= <u>1000</u>

e) අහිමි වන ආර්ථික සුභසාධනය = $\frac{1}{2} * 40 * 100$

= <u>2000</u>

3)

I. හීනවන ඵලදා නීතිය යනු, කෙටිකාලයේදී ස්ථාවර සාධක සමග යෙදෙන විචල්‍ය සාධක පමණක් ක්‍රමයෙන් වැඩි කරන විට ආන්තික ඵලදාව හා සාමාන්‍ය ඵලදාව ක්‍රමයෙන් අඩු වීමයි.
හීනවන ඵලදා නීතියට පදනම්වන උපකල්පන තුනකි.

- ස්ථාවර සාධක නොවෙනස්ව පැවතීම .
- තාක්ෂණය නොවෙනස්ව පැවතීම.
- සියලු විචල්‍ය සාධක සමජාතීය වේ.

පරිමාණානුකූල ඵල නීතිය යනු, දිගුකාලයේදී ආයතනයේ සියලුම යෙදවුම් වෙනස් කරන විට, යෙදවුම් හා නිමවුම් අතර පවතින සම්බන්ධතාව පරිමාණානුකූල ඵල නීතිය මගින් පැහැදිලි කරනු ලබන අතර පරිමාණානුකූල ඵල රටාවන් තුනක් දැකිය හැක.

- වැඩිවන පරිමානානුකූල ඵල

යෙදවුම් වෙනස් කරන අනුපාතයට වඩා වැඩි අනුපාතයකින් නිමවුම වෙනස් වේ නම් එය වැඩිවන පරිමාණානුකූල ඵල තත්ත්වයකි.

- අඩුවන පරිමාණානුකූල ඵල

යෙදවුම් වෙනස් කරන අනුපාතයට වඩා අඩු අනුපාතයකින් නිමවුම වෙනස් වේ නම් එය අඩුවන පරිමාණානුකූල ඵල තත්ත්වයකි.

- ස්ථාවර පරිමාණානුකූල ඵල

යෙදවුම් වෙනස් කරන අනුපාතයට සමාන අනුපාතයකින් නිමවුම් වෙනස්වන තත්ත්වයක් මෙයින් නිරූපණය කරනු ලබයි.

මේ අනුව හීනවන ඵල න්‍යාය හා පරිමාණානුකූල ඵල නීතිය යන දෙකම නිෂ්පාදන පිරිවැය කෙරෙහි සෘජුවම බලපායි.

Sabaragamuwa University of Sri Lanka

II. ගණකාධිකරණ පිරිවැය ලෙස සැලකෙන්නේ කිසියම් නිෂ්පාදන අයතනයක් විසින් මුදල් ගෙවා පිටතින් මිලදී ගනු ලබන යෙදවුම්වල පිරිවැය හෙවත් ඍජු පිරිවැය වේ. එහෙත් ආර්ථික පිරිවැය තුළ ඍජු පිරිවැය හා ආරෝපිත පිරිවැය යන සංරචක දෙකම ඇතුළත් වේ.

III. පූර්ණ තරඟකාරී ආයතනයක් මිලගනුවෙක් වේ. මෙම තත්ත්වය හටගනුයේ, ආයතනය සමජාතීය භාණ්ඩ නිපදවන නිසාත්, ආයතනය විසින් සපයනුයේ මුළු වෙළඳපොළ සැපයුමෙන් අතිශයින් කුඩා කොටසක් පමණක් වන නිසාත්, ගැනුම්කරුවන් සියලුම ආයතන අය කරනු ලබන මිල ගණන් පිළිබඳව පූර්ණ දැනුමක් අත් කරගෙන සිටින නිසාත් ය.

මිලගනුවෙකු වශයෙන් ක්‍රියා කරන නිෂ්පාදන ආයතනයක ඉල්ලුම් වක්‍රය ප්‍රස්තාරයක් මගින් පෙන්නුම් කරනුයේ පවත්නා වෙළඳපොළ මිල යටතේ ප්‍රමාණ අක්ෂයට සමාන්තරව අඳිනු ලැබූ සරල රේඛාවක් ලෙසය. එවැනි ඉල්ලුම් වක්‍රයක මිල නම්‍යතාව අපරිමිත හෝ පූර්ණ නම්‍ය අගයක් ගනී. ඉන් අදහස් වන්නේ පවත්නා වෙළෙඳපොළ මිලට ආයතනය කැමති ඕනෑම ප්‍රමාණයක් අලෙවි කළ හැකි බවයි.

කර්මාන්තයේ ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වන අතර එය පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයක් නොවේ. එක් අයතනයක් විසින් සපයනු ලබන භාණ්ඩය කර්මාන්තය තුළ සිටින සෙසු අායතන විසින් සපයනු ලබන භාණ්ඩවලට පූර්ණ ආදේශකයක් වේ. එබැවින් ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වේ. එහෙත් පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයක නම්‍යතාව රඳාපවතිනුයේ, එම කර්මාන්තය සපයන භාණ්ඩය සහ වෙළෙඳපොළේ අවශේෂ භාණ්ඩ හා සේවා අතර කොතරම් ආදේශකත්වයක් පවතිනවා ද යන්න මතය.

IV. ප්‍රවේශයට බාධා පැවතීම යනු නව සැපයුම්කරුවන්ට වෙළෙඳපොළට ප්‍රවේශ වීමට එරෙහිව ක්‍රියාත්මක වන විවිධ බාධක පැවතීමයි.

උදා-:

- භාණ්ඩය නිපදවීමට අවශ්‍ය සම්පතක් හෝ අවශ්‍ය එක් විශේෂිත සම්පතක් ආයතනය සතුව නොපැවතීම.
- විශාල ප්‍රග්ධනයක් අවශ්‍ය වීම.
- රජය විසින් එක් ආයතනයකට පමණක් බලපත්‍ර ලබාදීම.
- ආයතනය විසින් සිදු කරන බාධා
- ආයතනය සතුව පරිමාණානුකූල පිරිමැසුම් පැවතීම.

V.

a) ලාභය / අලාභය = මුළු අයභාරය - මුළු පිරිවැය

= (P × Q) - (ATC × Q)

=100 × 40 - 120 × 40

= 4000 - 4800

= (- 800)

b) සාමාන්‍ය ස්ථාවර පිරිවැය = සාමාන්‍ය මුළු පිරිවැය - සාමාන්‍ය විචල්‍ය පිරිවැය

AFC = ATC – AVC

AFC = 120 - 80

AFC = 40

මුළු ස්ථාවර පිරිවැය = සාමාන්‍ය ස්ථාවර පිරිවැය × නිමවුම

TFC = AFC × Q

= 40 × 40

= 1600

Sabaragamuwa University of Sri Lanka

4)

I. ජාතික ආදායමේ පවත්නා මට්ටමේ සිට ඉහළ නැගීමට හෝ පහළ බැසීමට ප්‍රවණතාවක් නොදක්වන විට එය සමතුලිත ආදායම් මට්ටම ලෙස නිර්වචනය කෙරේ. සමතුලිත තත්ත්වය සඳහා අවශ්‍ය කරන කොන්දේසිය විකල්ප ප්‍රවේශ දෙකක් ඔස්සේ පෙන්නුම් කළ හැකිය.

ආදායම = වියදම් ප්‍රවේශය

$Y = E$

- සැලසුම් කළ වියදම නිමැවුමේ වටිනාකමට සමාන වීම.

කාන්දුවීම් = විදීම් ප්‍රවේශය

$W = J$

- වියදම් ප්‍රමාණයේ කාන්දුවීම් හා විදීම් එකිනෙකට සමාන වේ.

සමතුලිත ජාතික ආදායම සහ පූර්ණ සේවා නියුක්ති ජාතික ආදායම යනු එකක් නොවන බව විශේෂයෙන් අවධාරණය කළ යුතුය.

පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම යනු ආර්ථිකයේ සියලුම සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය කළ විට, ලබා ගන්නා ආදායම් මට්ටමයි. සමතුලිත ජාතික ආදායම පූර්ණ සේවා නියුක්ති මට්ටමේ හෝ පූර්ණ සේවා නියුක්ති මට්ටමට වඩා පහළින් හෝ ඉහළින් තීරණය විය හැකිය. ඒ සඳහා අවශ්‍ය කොන්දේසිය වන්නේ නිමැවුමේ වටිනාකමට සමාන වියදමක් (Y=E) හටගැනීම හෝ කාන්දුවීම් විදීම්වලට සමාන වීම (W=J) පමණි.

පූර්ණ සේවා නියුක්ති මට්ටමේදී එම කොන්දේසි ඉටු වුවොත් එය ප්‍රශස්ත සමතුලිතයකි. පූර්ණ සේවා නියුක්ති මට්ටමට වඩා අඩු මට්ටමක ඉහත කොන්දේසි ඉටුවිය හැක. එයද සමතුලිතයකි. එහෙත් එතනදී සේවා වියුක්තියක් හෝ පසුබැස්මක් හෝ අවධමනයක් තිබේ. පූර්ණ සේවා නියුක්ති මට්ටම ඉක්මවා ඉහත කොන්දේසි ඉටු වී සමතුලිත බිහිවිය හැක. එහිදී උද්ධමනයක් පවතී . ඒ නිසා සමතුලිතය යනු හැමවිටම ප්‍රශස්ත (පූර්ණ සේවා නියුක්තිය) නොවේ. කෙටිකාලීනව සමාහාර ඉල්ලුම විශාලත්වය මත සමතුලිත මට්ටම තීරණය වේ.

II. ඉතුරුම් ගිලිහීමකි. වත්මන් පරිභෝජනය අඩු වේ. එම ඉතුරුම් ද පරිභෝජනයට යොමු වුනේ නම් සමාහාර ඉල්ලුම වැඩි වේ. එහෙත් විභව නිමැවුම වැඩි නොවේ.

නමුත් ඉතුරුම් වශයෙන් ගිලිහෙන දේ දිගුකාලීනව ආයෝජනයට යොමු වී රටේ භෞතික සම්පත් ආයෝජන භාණ්ඩ නිෂ්පාදනය සඳහා යෙදවීම මඟින් පළමු වටයේම විභව නිමැවුම වැඩිවේ. ඉන්පසු ගුණක ක්‍රියාවලියක් ඔස්සේ පෙළඹ වූ පරිභෝජනය වට කිහිපයකින් සිදු වී, සමස්ත පරිභෝජනය වැඩි වේ.

III.

a.)

අයිතමය	රු. මිලියන
සේවක ගෙවීම්	3300
නිෂ්පාදනය මත අනෙකුත් (ශුද්ධ) බදු	150
ශුද්ධ මෙහෙයුම් අතිරික්තය	6000
මිශ්‍ර ආදායම	750
ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය	800
මූලික මිලට සමස්ත එකතු කළ අගය	**11000**

b.)

අයිතමය	රු. මිලියන
මූලික මිලට සමස්ත එකතු කළ අගය	11000
භාණ්ඩ හා සේවා මත (ශුද්ධ) බදු	500
වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය	**11500**

Sabaragamuwa University of Sri Lanka

c.)

අයිතමය	රු. මිලියන
වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය	11500
විදේශ ප්‍රාථමික ආදායම් ලැබීම්	180
එකතුව	11680
විදේශ ප්‍රාථමික ආදායම් ගෙවීම්	(470)
දළ ජාතික ආදායම	**11210**

d.)

අයිතමය	රු. මිලියන
දළ ජාතික ආදායම	11210
ගෙවුම් තුලනයේ ද්විතියික ආදායම් ගිණුමේ ශේෂය	1200
වැය කළ හැකි දළ ජාතික ආදායම	**12410**

e.)

අයිතමය	රු. මිලියන	
වැය කළ හැකි දළ ජාතික ආදායම		12410
කුටුම්භ අංශයේ අවසන් පරිභෝජනය	8000	
රාජ්‍ය අංශයේ අවසන් පරිභෝජනය	1000	(9000)
ජාතික ඉතුරුම්		**3410**

f.)

අයිතමය	රු. මිලියන
ජාතික ඉතුරුම්	3410
ආයෝජනය	(3700)
	(290) ණයගැතියෙකි

IV.

a) C = 500 + 0.8Yd

C = 500 + 0.8 (3900)

C = 500 + 3120

C = 3620

Y = C + J

Y = 3620 + 380

<u>Y = 4000</u>

b) $K = \frac{1}{1-0.8}$

<u>K = 5</u>

Sabaragamuwa University of Sri Lanka

c) Y- nt = Yd

4500 – nt = 3900

nt = 4500 – 3900

<u>net tax (ශුද්ධ බදු) = 600</u>

d) $\frac{4500}{4000} > 500$

<u>අවධමන පරතරය = 500</u>

e) $5 = \frac{500}{\Delta J}$

$$\Delta J = \frac{500}{5}$$

$$\underline{\Delta J = 100}$$

මුළු විදීම් 100කින් වැඩි විය යුතුය. එනම් මුළු විදීම් 380+100=480ක් විය යුතුය.

V. දළ දේශීය වියදමට භාණ්ඩ හා සේවා , ආදායම් ගිණුම්වල ශේෂ එකතු කළ විට දළ ජාතික නිෂ්පාදන වියදම ලැබේ. දළ දේශීය වියදමට වඩා දළ ජාතික නිෂ්පාදනය අඩු නම් එය එරට ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ භාණ්ඩ, සේවා හා ආදායම් ගිණුම් ශේෂයේ සෘණ අගයක් ලෙස පිළිඹිබු වනු ඇත. දළ ජාතික නිෂ්පාදනයේ අගය වැඩි නම් එය ධන අගයක් ලෙස පිළිඹිබු වනු ඇත.

5)

I. අයවැය ලේඛනය තුලනය වි ඇති විට එමඟින් සමතුලිත ජාතික ආදායමට ඇතිකරන ප්‍රසාරණාත්මක බලපෑම තුලිත අයවැය ගුණනය නම් වේ. අයවැය ලේඛනය තුලනය වන විටකදී එමඟින් සමතුලිත නිමවුම් මට්ටමට ඇති කරන බලපෑම ශුන්‍යය යැයි බැලූ බැල්මට පෙනුනද එය එසේ නොවන අතර එමඟින් ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කෙරේ. මන්ද රාජ්‍ය වියදම සෘජුවම සමස්ත වියදමටද, ඒ ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතයටද බලපායි.

$(\Delta G \longrightarrow \Delta E \longrightarrow \Delta Y)$

එහෙත් බදු දළ දේශීය නිෂ්පාදිතයට ඇති කරන බලපෑම වක්‍රාකර වේ. එනම් බදු අය කිරීම, පළමුව වැය කළ හැකි ආදායමට ද, දෙවනුව සමස්ත වියදමට ද, බලපෑම තුළින් ද.දේ.නි. බලපායි.

$(\Delta G\uparrow \longrightarrow \Delta Yd \longrightarrow \Delta E \longrightarrow \Delta Y)$

මේ නිසා රාජ්‍ය වියදම නිසා සිදුවන ප්‍රසාරණාත්මක බලපෑම, බදු නිසා ඇතිවන සංකෝචනාත්මක බලපෑමට වඩා බලවත් බැවින් තුලිත අයවැය ලේඛනයක් මගින් සමතුලිත ආදායමට ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කරයි.

තුලිත අයවැය ගුණනය = රාජ්‍ය වියදම් ගුණනය + බදු ගුණනය

$$(K_G + K_T) = \frac{1}{1-b} + \frac{-1}{1-b}$$

$$= \frac{1-b}{1-b}$$

$$= \underline{\underline{1}}$$

Sabaragamuwa University of Sri Lanka

II.

a)

$C = 100$

$I = 250$

$G = 300$

$Nx = -200$

<u>රු. බිලියන= 450</u>

$C = 250 + 0.75Yd$

$= 250 + 0.75 (Y - T)$

$= 250 + 0.75 (Y - 200)$

$= 250 + 0.75Y - 150$

<u>$C = 100 + 0.75Y$</u>

b) $S = -250 + 0.25Yd$

c) <u>සමාහාර වියදම් ආදායම් ප්‍රවේශය</u>

$E = C + I + G + (X - M)$

$= 250 + 0.75 Yd + 250 + 300 + (-200)$

$= 250 + 0.75 (Y - 200) + 250 + 300 + (-200)$

$= 250 + 0.75 Y - 150 + 250 + 300 + (-200)$

$= 450 + 0.75 Y$

$Y = E$

$Y = 450 + 0.75 Y$

$1 - 0.75 Y = 450$

$0.25 Y = 450$

$Y =$ රු බිලියන 1800

Sabaragamuwa University of Sri Lanka

<u>විදීම් කාන්දුවී ප්‍රවේශය</u>

$W = S + NT + M$

$W = -250 + 0.25Yd + 200 + 300$

$W = -250 + 0.25(Y - T) + 200 + 300$

$W = -250 + 0.25(Y - 200) + 200 + 300$

$W = 250 + 0.25Y - 50$

$W = 200 + 0.25Y$

$W = J$

$200 + 0.25Y = I + G + X$

$200 + 0.25Y = 250 + 300 + 100$

$200 + 0.25Y = 650$

$0.25Y = 650 - 200$

$0.25Y = 450$

<u>Y = රු බිලියන 1800</u>

d) රාජ්‍ය වියදම වැඩි වීමේ ප්‍රසාරණාත්මක බලපෑම

$(\Delta G = 50)$

$\Delta Y = K_G * \Delta G$

$\Delta Y = \frac{1}{1-b} * 50$

$\Delta Y = \frac{1}{1-0.75} * 50$

$\Delta Y = \frac{1}{0.25} * 50$

$\Delta Y = 200$

ජාතික ආදායම රුපියල් බිලියන 200කින් ප්‍රසාරණය වේ.

ස්ථාවර බදු ඉහළ යාමේ සංකෝචනාත්මක බලපෑම

$(\Delta T_X = 75)$

$\Delta Y = KT_X * \Delta T_X$

Sabaragamuwa University of Sri Lanka

$$\Delta Y = \frac{-b}{1-b} * 75$$

$$\Delta Y = \frac{-0.75}{1-0.75} * 75$$

$$\Delta Y = \frac{-0.75}{0.25} * 50$$

$$\Delta Y = -225$$

ජාතික ආදායම රුපියල් බිලියන 225කින් සංකෝචනය වේ.

සමස්ත බලපෑම ⟶ සමස්ත ජාතික ආදායම රුපියල් බිලියන 25කින් සංකෝචනය වේ. (200 – 225 = - 25)

III. එකඟ වේ.

රු.මිලි 100කින් බදු ඉහළ දැමූ විට එම ප්‍රමාණයෙන්ම සමස්ත වියදම සෘජුවම අඩුවන්නේ නැත. හේතුව බදුවල වෙනස්වීම සමස්ත ඉල්ලුමට වක්‍රාකාරව බලපානු ලැබීමයි. මෙහිදී බදු ඉහළ යාම මුලින්ම බලපෑම් කරනුයේ වැය කළ හැකි ආදායම මතයි. ඉන් පසුව සමස්ත ඉල්ලුම කෙරෙහි බලපායි. වැය කළ හැකි ආදායම අඩු වූ විට එහි ප්‍රතිඵලයක් ලෙස පාරිභෝගික වියදම පහත වැටේ. ඒ අනුව ගුණක ප්‍රතිඵල ඇති කරමින් මූර්ත ආදායමට බලපෑම් කරයි.

රු.මිලි.100කින් ආණ්ඩුවේ මිලදී ගැනීම් අඩු වූ විට ඒ හා සමාන ප්‍රමාණයකින්ම මූර්ත දළ දේශීය නිෂ්පාදිතය අඩු වේ. ආණ්ඩුවේ මිලදී ගැනීම් සෘජුවම මූර්ත දළ දේශීය නිෂ්පාදිතයට බලපෑම් කරයි. එනම් රු.මිලි.100ක් ආණ්ඩුවේ මිලදී ගැනීම් අඩු වූ විට හා ඒ හා ප්‍රමාණයකින්ම බදු ඉහළ යනවිට ඇතිවන බලපෑමට වඩා විශාල ගුණක ප්‍රතිඵල සහිත සංකෝචනාත්මක බලපෑමක් මූර්ත ද .දේ. නි මත ඇතිවේ.

IV.

a) S = Yd – C
S = 5400 – 4200
S = 1200

b) BD = G – T
100 = G – 600
G = 700

T = Y - Yd
T = 6000 – 5400
T = 600

c) S + T + M = I + G + X
1200+ 600 + 250 = I + 700 + 50
I = 1300

NX = X – M
-200 = 50- M
M = 250

Sabaragamuwa University of Sri Lanka

'ආ' උප කොටස
(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න)

6)

I. a) එකඟ වේ.

තනි වාණිජ බැංකුවකට කළ හැක්කේ තම අධි සංචිත ප්‍රමාණය උපරිම වශයෙන් ණයට ලබාදීම පමණි.

b)

- විදේශ ආයෝජකයන් තුළ ආර්ථිකය පිළිබඳ විශ්වාසනීයත්වයක් ගොඩනැගීම.
- ආර්ථික වර්ධන මට්ටම හඳුනාගැනීම.
- රාජ්‍ය මූල්‍ය විනය පිළිබඳ අවබෝධයක් ගත හැකි වීම.
- ජාත්‍යන්තර ණය බර පාලනය කිරීම.
- ආර්ථික ස්ථායීතාවය පිළිබඳව අවබෝධයක් ලබාගත හැකිවීම.

II. සමාහාර වියදමේ සංරචක

- පරිභෝජන වියදම (C)
- ආණ්ඩුවේ මිලදී ගැනීම (G)
- ආයෝජන වියදම (I)
- ශුද්ධ අපනයන (Nx)

ආර්ථිකයේ සමාහාර වියදම් ඉහළ යනවිට සමාහාර ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ. සමාහාර සැපයුම නොවෙනස්ව තිබියදී සමාහාර ඉල්ලුම වැඩි වනවිට ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය සක්‍රීය වේ.



සමාහාර සැපයුම් වක්‍රය AS වශයෙන් දක්වා ඇත. සමාහාර ඉල්ලුම AD_1 සිට AD_2 දක්වා වැඩි වනවිට ආදායම් මට්ටම Y_1 සිට Y_2 දක්වාත්, මිල මට්ටම P_1 සිට P_2 දක්වාත් ඉහළ නගී.

Sabaragamuwa University of Sri Lanka

III. a) M_1 = CP + DDP

7900 = 3200 + 4700

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය = 470 /4700 * 100 = 10%

තැන්පතු ප්‍රසාරණ ගුණකයක (K) = 1/r = 1/0.1=10

බැංකු ලබා දී ඇති මුළු ණය රු.මි. 4230.00

10%

DDP	4700	සංචිත	470
		ණය	4230
	4700		4700

b) තැන්පතු ප්‍රසාරණ ගුණකයක (K) = 1/r = 1/0.2= 5

20%

DDP	2350	සංචිත	470
		ණය	1880
	2350		2350

MS = CP + DDP

= 3200 + 2350

= 5550

IV. වර්තමාන පොලිය වැඩි වනවිට අනාගත පොලිය අඩු වෙතැයි අපේක්ෂා කරන සමපේක්ෂකයන් ඒ සමඟ පිළිනපත් මිල වැඩිවෙතැයි අපේක්ෂා කරන අතර ප්‍රාග්ධන ලාභ ලබාගැනීමේ අදහසින් පිළිනපත් මිලදී ගනී. එවිට සමපේක්ෂණ මුදල් ඉල්ලුම අඩුවේ.

V.

- මූර්ත ආදායම පහළ යාම.
- ඉතුරුම් අධෛර්යමත් වීම.
- ණය ගනුදෙනු අධෛර්යමත් වීම.
- නිෂ්පාදනය කාර්යක්ෂමතාවය පහත වැටීම.
- ආර්ථික කාර්යක්ෂමතාවය පහත වැටීම.
- ගෙවුම් ශේෂ දුෂ්කරතා ඇතිවීම.
- නිරපේක්ෂ දරිද්‍රතාවය ඉහළ යාම.

Sabaragamuwa University of Sri Lanka

7)

I. පොදු භාණ්ඩ යනු: පරිභෝජනයේ තරඟකාරීත්වයක් දක්නට නොමැති (එනම්, එක් පුද්ගලයකුගේ පරිභෝජනය නිසා තවත් අයෙකුට පරිභෝජනයට ඇති අවස්ථාව අහිමි නොවන) හා පරිභෝජනයෙන් බැහැර කළ නොහැකි (එනම් මිලක් නොගෙවන්නේ නම් පරිභෝජයෙන් බැහැර කළ නොහැකි) භාණ්ඩ හා සේවා වේ.

උදා : ප්‍රදීපාගාර, ඔරලෝසු කණු, විදී ආලෝකකරණය ,මහා මාර්ග

පොදු සම්පත් යනු : පරිභෝජනයේ තරඟකාරිත්වයක් පවතින නමුත් මිලක් නොගෙවන්නන් පරිභෝජනයේ බැහැර කළ නොහැකි භාණ්ඩ වේ.

උදා: මත්ස්‍ය සම්පත, හිරු එළිය, ස්වභාවික වාතය , වැසි ජලය

II. වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ මිල යාන්ත්‍රණය ක්‍රියාත්මක වුවද එහි ඇති යම් යම් ඌනතා දුරු කිරීම සඳහා වෙළෙඳපොළ අර්ථ ක්‍රමයක් තුළ ඇත්තේ රජයේ නොවැළැක්විය හැකි කාර්යභාරයකි.

- වෙළෙඳපොළ යාන්ත්‍රණය කාර්යක්ෂමව ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය කරන නෛතික පදනම හා සමාජීය පරිසරය සම්පාදනය කිරීම.
- වෙළෙඳපොළ අසාර්ථක වීම නිසා පැන නගින සම්පත් බෙදීයාමේ අකාර්යක්ෂමතා ඉවත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- සම්පත් බෙදීයාමේ සාධාරණත්වය තහවුරු කිරීම.
- ආර්ථික වෘද්ධිය ඉහළ නැංවීම.
- සාර්ව ආර්ථික ස්ථායිතාව පවත්වාගෙන යාම.

III. නිෂ්පාදනයේ ධන බාහිරතා

කිසියම් නිෂ්පාදන ක්‍රියාවලියක් නිසා හටගන්නා එහෙත් එම ක්‍රියාව සිදුකරන පාර්ශ්වයන් විසින් සැලකිල්ලට නොගන්නා පරිබාහිර පාර්ශ්වයන් මත ඇති කරන හිතකර ප්‍රතිවිපාක නිෂ්පාදනයේ ධන බාහිරතා ලෙස හැඳින්වේ.මේ අනුව, Port City ව්‍යාපෘතිය නිසා එම ප්‍රදේශයේ ජනතාවට පහත ප්‍රතිලාභ බුක්ති විඳිය හැකිය.

- විවිධ අතිරේක අදායම් මාර්ග බිහිවීම.
- ප්‍රවාහන පහසුකම් සංවර්ධනය වීම.
- විදේශීය වෙළඳාම ශක්තිමත්වීම.
- ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාම.
- යටිතල පහසුකම් සංවර්ධනය වීම.
- නව ආකල්ප වර්ධනය වීම.



- * MCp = ආන්තික පෞද්ගලික පිරිවැය
- * MCs = ආන්තික සමාජ පිරිවැය
- * MB = ආන්තික ප්‍රතිලාභ
- * Qp = වෙළෙඳපොළ බලවේග මගින් තීරණය වන නිමැවුම
- * Pp = වෙළෙඳපොළ බලවේග මගින් තීරණය වන මිල
- * Qs = සමාජීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම
- * Ps = සමාජීය වශයෙන් ප්‍රශස්ත මිල

ඌණ නිෂ්පාදිතය

Sabaragamuwa University of Sri Lanka

IV. දෙන ලද වර්ෂයක රාජ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට දරන වියදම් හා වර්තන සංක්‍රාමවල එකතුවයි. මේවා නැවත නැවතත් දැරිය යුතු වියදම් වේ.

උදාහරණ :- රාජ්‍ය සේවක වැටුප්, ණය පොලී, පොහොර සහනාධාර, විශ්‍රාම වැටුප්

පුනරාවර්තන වියදම් ඉහළ මට්ටමක පැවතීමේ ප්‍රතිවිපාක

- ඉහළ පුනරාවර්තන වියදම් රාජ්‍ය ඉතුරුම් කෙරෙහි අහිතකර ලෙස බලපෑම් සිදුකරනු ලබන අතර එය දේශීය ඉතුරුම් අඩු කිරීමට හේතු වේ.
- වර්තන වියදම් ඉහළ මට්ටමක පැවතීම නිසා සමස්ත ඉල්ලුම ද ඉහළ යන අතර ඉල්ලුමෙන් ඇදුණු උද්ධමන පීඩන හටගැනීම.
- වර්තන වියදම් ඉහළ යාම නිසා ප්‍රාග්ධන වියදම් දැරීමට ඇති සම්පත් අඩුවීම නිසා එය ආර්ථික වර්ධනයට අහිතකර ලෙස බලපෑම
- අයවැය හිඟය වැඩිවීම තුළ රජයේ ණය බර ඉහළ යාම.

V. ෆිස්කල් ප්‍රතිපත්තිය යනු, මිල ස්ථායිතාව, ආදායම් විෂමතාව අඩු කිරීම වැනි සාර්ව ආර්ථික අරමුණු ඉටුකර ගැනීම සඳහා රාජ්‍ය බදු, රාජ්‍ය වියදම්, රාජ්‍ය අයවැය හිඟය හා අතිරික්තය මෙන්ම රාජ්‍ය ණය යනාදිය වෙනස් කිරීමට අදාළ රාජ්‍ය ප්‍රතිපත්තියයි.

ආදායම් ව්‍යාප්ති විෂමතා අඩු කිරීමට ෆිස්කල් ප්‍රතිපත්තිය යොදා ගැනීම.

- අනුක්‍රමික පදනමකින් සෘජු බදු අය කිරීම.
- අඩු ආදායම්ලාභීන්ට සංක්‍රාම ලබාදීම.
- අයවැය හිඟය උද්ධමනය නොවන මූලාශ්‍රයන්ගෙන් පියවීම.
- අඩු ආදායම්ලාභීන්ට අදාළ අධ්‍යාපනය, සෞඛ්‍යය, නිවාස සඳහා රාජ්‍ය වියදම් ඉහළ නැංවීම.
- ඉහළ ආදායම්ලාභීන් පරිභෝජනය සිදුකරන සුඛෝපභෝගී භාණ්ඩ මත පනවන බදු ඉහළ නැංවීම.
- සමාජ ආරක්ෂණ ජාල සඳහා රාජ්‍ය වියදම් වෙන් කිරීම.
  (උදා :- පිං පඩි, වැන්දඹු හා අන්ත්දරු)

8)

I. භාණ්ඩ දෙකම නිපදවීම සඳහා ජපානයට නිරපේක්ෂ වාසි ඇති නිසා සාපේක්ෂ වාසි න්‍යාය අනුව විශේෂීකරණය විය යුතු ආකාරය බැලිය යුතුය. ඒ සඳහා භාණ්ඩ දෙක පිළිබඳ ආවස්ථික පිරිවැය ගණනය කළ යුතුය.

		ජපානය	ඉන්දියාව
පරිගණක ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය	=	$\frac{150}{50}$	$\frac{50}{10}$
	=	3 මෝටර් රථ	5 මෝටර් රථ
මෝටර් රථ ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය	=	$\frac{50}{150}$	$\frac{10}{50}$
පරිගණක	=	0.33 පරිගණක	0.2

ඉහත දත්තවලට අනුව,

ජපානයට පරිගණක නිපදවීම සඳහා අවම ආවස්ථික පිරිවැයක් ඇති බැවින් ජපානය පරිගණක නිෂ්පාදනය සඳහා විශේෂීකරණය විය යුතුය.
ඉන්දියාවට මෝටර් රථ නිෂ්පාදනය සඳහා අවම ආවස්ථික පිරිවැයක් ඇති බැවින් ඉන්දියාව මෝටර් රථ නිපදවීම සඳහා විශේෂීකරණය විය යුතුය.

Sabaragamuwa University of Sri Lanka

II.

- සම්පත් සම්භාරයේ වෙනස්කම්
- යෙදවුම්වල ගුණාත්මක තත්ත්වය
- අභිරුචිය වෙනස්කම්
- පරිමාණානුකූල පිරිමැසුම්
- නිෂ්පාදන ප්‍රභේදනය
- තාක්ෂණික වෙනස්කම්
- රාජ්‍ය ප්‍රතිපත්ති
- උද්ධමනය
- ස්ථානගතවීම.

III.

- සලාක කිරීම හෙවත් කෝටා කිරීම.
- ප්‍රපාතනය
- ස්වෙච්ඡාවෙන් අපනයන සීමා පැනවීම.
- විදේශ විනිමය පාලනය
- අපනයන හා ආනයන සීමා පැනවීම.
- වෙළඳ සම්බාධක පැනවීම.
- පරිපාලන හා තාක්ෂණික ප්‍රමිතීන් නියාමනය කිරීම.
- දේශීය නිෂ්පාදකයන්ට දිරිගැන්වීමේ හෝ සහනාධාර ලබාදීම.

IV.

අරමුණ

- බහු පාර්ශ්වීය වෙළඳාම ප්‍රවර්ධනය කිරීම.
- වෙළඳාම ක්‍රමවත්ව පවත්වාගෙන යාම.
- වෙළඳ බාධක අවම කිරීම හා වෙළෙඳ නීති සංශෝධනය කිරීම මගින් ජාත්‍යන්තර වෙළෙඳ ක්‍රමය තුළ ප්‍රධාන ප්‍රතිසංස්කරණයන් ඇති කිරීම.

කාර්යයන්

- ලෝක වෙළඳ සංවිධානය යටතේ රටවල් අත්සන් කොට ඇති ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම් නිසිලෙස ක්‍රියාත්මක වේද යන්න පරිපාලනය කිරීම.
- නිදහස් වෙළඳාම ප්‍රවර්ධනය කර ගැනීමට අදාළ සාකච්ඡා සඳහා වේදිකාවක් සැපයීම.
- වෙළෙඳපොළ ආරවුල් බේරුම් කිරීම.
- සාමාජික රටවල ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම
- තාක්ෂණික ආධාර හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් සංවර්ධනය වන වෙළෙඳපොළ ප්‍රතිපත්ති පිළිබඳ ගැටලු විසඳා ගැනීමට ආධාර කිරීම.
- වෙනත් ජාත්‍යන්තර ආර්ථික සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

V.

- ද්වි පාර්ශ්වීය ගිවිසුම් - ඉන්දු ලංකා නිදහස් වෙළඳ ගිවිසුම, පාකිස්තානු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- බහු පාර්ශ්වීය ගිවිසුම් - දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)

Sabaragamuwa University of Sri Lanka

9) I

a)

- දේශීය ඉතුරුම් පහළ මට්ටමක පැවතීම.
- විදේශීය ආයෝජන දිරිමත් කිරීමට ව්‍යාපාර පරිසරයක් නොමැති වීම.
  (ආර්ථික නිදහස , දියුණු යටිතල පහසුකම් , යහපාලනය)
- මානව සම්පත්වල ගුණාත්මක බව (ශ්‍රම ඵලදායිතාව අඩුවීම හා ශ්‍රම වෙළඳපොළෙහි දුර්වලතා)
- ව්‍යවසායකත්වයේ හිඟතාව
- තාක්ෂණික දියුණුව සඳහා අවශ්‍ය දැනුම හිඟකම
- ආර්ථික ප්‍රතිපත්තිවල අවිනිශ්චිත බව
- රාජ්‍ය අංශයේ අකාර්යක්ෂමතා
- සංවර්ධිත රටවල් අනුගමනය කරන ආරක්ෂණවාදී ප්‍රතිපත්ති
- වෙළෙඳපොළ පටු වීම.
- විදේශ ණයගැතිභාවය
- සම්පත් ඌන උපයෝජනය
- රාජ්‍ය මූල්‍ය ගැටලු

b) <u>වාසි</u>

- ඉහළ ජීවන මට්ටමක් ඇති කරගත හැකි වීම -
  ආර්ථික වෘද්ධිය හේතුවෙන් පෙරට වඩා වැඩි භාණ්ඩ හා සේවා ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට හා පරිභෝජනය කිරීමට හැකි වීම.
- සේවා නියුක්තිය ඉහළ යාම -
  ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය වේගවත් වීම ඔස්සේ ශ්‍රමය සඳහා වන ඉල්ලුම ද ඉහළ යන බැවින් විරැකියාව අඩු වී සේවා නියුක්ති අනුපාතය ඉහළ යාම.
- රාජ්‍ය අයභාරය ශක්තිමත් වීම -
  නිෂ්පාදනය සහ ආදායම් මට්ටම ඉහළ යාම හේතු කොටගෙන ඉහළ බදු අයභාරයක් උපයාගත හැකි බැවින් ආණ්ඩුවේ අයභාරය ශක්තිමත් වේ.
- ඉතුරුම් ඉහළ යාම -
  ආර්ථික වෘද්ධි ක්‍රියාවලියේදී වැය කළහැකි ආදායම ඉහළ යන අතර ඉන් පාරිභෝජනය සඳහා වියදම් කර ඉතිරි වන ප්‍රමාණය එනම්, ඉතුරුම් ඉහළ යාම සිදුවේ.
- ආයෝජනයට සම්පත් සපයා ගැනීම -
  නිෂ්පාදන හා ආදායම් වැඩි වනවිට භාණ්ඩ ඉල්ලුම ප්‍රසාරණය වන බැවින් නිෂ්පාදනය ප්‍රසාරණය කිරීම සඳහා දේශීය හා විදේශීය ආයෝජන වැඩි කිරීමට සිදුවේ.
- ගෙවුම් ශේෂය ශක්තිමත් වීම.
- මිල ස්ථායිතාව පවත්වාගෙන යාම.

<u>අවාසි</u>

- උද්ධමන ප්‍රවණතා පැන නැගීම -
  * නිෂ්පාදන සම්පත් සඳහා ඇති ඉල්ලුම ශීඝ්‍රයෙන් ඉහළ යාම නිසා ශ්‍රමය ඇතුළු නිෂ්පාදන සාධකවල මිල ඉහළ යාමෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම.
  * පාරිභෝගික ආදායම ඉහළ යාම නිසා පාරිභෝජන භාණ්ඩ හා සේවා සඳහා වන ඉල්ලුම ප්‍රසාරණය වීමෙන් භාණ්ඩ හා සේවා මිල ගණන් ඉහළ යාම.
- නිෂ්පාදනය හා පරිභෝජනය ඉහළ යාමෙන් පාරිසරික ගැටලු ඇතිවීම. ආර්ථික වෘද්ධිය සමග සිදුවන පරිසර දූෂණය , පාරිසරික හායනය , ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් විනාශ වී යාම මගින් නිෂ්පාදනයේ හා පරිභෝජනයේ ඍණ බාහිරතා හටගැනීම.
- ආදායමේ හා ධනයේ, ව්‍යාප්ති විෂමතා පැන නැගීම - ආර්ථික වෘද්ධියේ ප්‍රතිලාභ එක හා සමාන ආකාරයට නොවන විට ආදායමේ හා ධනයේ, ව්‍යාප්ති විෂමතා හටගනු ලබයි.
  - ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් විනාශ වීම නිසා අනාගත පරම්පරාවට පරිභෝජනයට ඇති සම්පත් අහිමි වී යාමෙන් තිරසාර සංවර්ධනයට බාධා ඇති වීම.
  - ආර්ථික වෘද්ධිය සමඟ නව තාක්ෂණය ප්‍රවේශ වීම නිසා රැකියා පිළිබඳ අවිනිශ්චිතතාවයක් ඇතිවීම.

Sabaragamuwa University of Sri Lanka

II. ආදායම් දරිද්‍රතාවයේ පැතිකඩ දෙකකි.

- සාපේක්ෂ දරිද්‍රතාවය
- නිරපේක්ෂ දරිද්‍රතාවය

සාපේක්ෂ දරිද්‍රතාවය යනු, ජනගහනයේ එක් කොටසකගේ සමාජ ආර්ථික තත්ත්වයන් සමඟ සලකා බලන විට තවත් කොටසකගේ සමාජ ආර්ථික තත්ත්වයන් සාපේක්ෂ වශයෙන් පහත් වීමය. සාපේක්ෂ දරිද්‍රතාව රටක සම්පත් හා ආදායම් ව්‍යාප්තියේ ස්වභාවය මත රඳා පවතී. කිසියම් රටක මධ්‍යම ආදායම් මට්ටමට සාපේක්ෂව එක් එක් පුද්ගලයන් හෝ කුටුම්භ හිමිකරගන්නා ආදායම් මට්ටම තුලනාත්මකව විග්‍රහ කිරීම සාපේක්ෂ දරිද්‍රතාවය ලෙස ලෝක බැංකුව විග්‍රහ කරයි.

නිරපේක්ෂ දරිද්‍රතාවය යනු, පුද්ගලයකුට හෝ කුටුම්භයකට හෝ තම මූලික අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය කරන අවම ආදායම් ප්‍රමාණය නොමැති තත්ත්වයයි. එනම් ජන කොට්ඨාසයක් අන්ත දරිද්‍රතාවයෙන් පෙළෙන බවයි. මේ නිසා රටක නිරපේක්ෂ දරිද්‍රතාවය වැඩි වනවිට එම රටෙහි මන්දපෝෂණය, ළදරු මරණ , නූගත්කම යනාදිය වැඩි වන අතර රටේ ජනතාවගේ ආයු අපේක්ෂාව පහළ මට්ටමක පවතී. නිරපේක්ෂ දරිද්‍රතාවය යනු, යම් පුද්ගලයකුට පහත සාධකවල හඳුනාගත් අවම ශුද්ධ සාධක මට්ටමක් භුක්ති විඳීමට හැකියාවක් නොමැති වීමයි.

පරිභෝජන මට්ටම
මානුෂීය අවශ්‍යතා - නිවාස , සෞඛ්‍ය හා අධ්‍යාපන සුදුසුකම්

නිරපේක්ෂ දරිද්‍රතාවය යනු, ලෝකයෙන් තුරන් කළ හැකි තත්ත්වයකි. නමුත් සාපේක්ෂ දරිද්‍රතාවය ලොව ඕනෑම රටක දක්නට ලැබෙන තත්ත්වයකි . එය ලෝකයෙන් තුරන් කළ නොහැකි නමුත් අවම කළ හැක.

III.

- ස්වාභාවික ආපදා නිසා කෘෂිකර්මාන්තයට හානි සිදුවීම - ගංවතුර , නියගය , අධික වර්ෂාව වැනි ස්වාභාවික ආපදා නිසා වගාවන්ට හානි සිදු වීම.

- විදේශ විනිමය හිඟවීම - අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය (හාල් , සීනි , පරිප්පු , ලූණු) ආනයනය කිරීම සීමා කිරීම.

- ඉන්ධන විදුලිය නොමැති වීම - සම්පත් පූර්ණ ලෙස උපයෝජනය නොවීම ,අස්වනු නෙලීම , ප්‍රවාහනය නිසි කාලයේදී කළ නොහැකිවීමෙන් ඵලදාව විනාශ වීම හෝ අඩුවීම.

- ආහාර අපතය හා නාස්තිය - ආහාර ප්‍රවාහනය , ගබඩා කිරීමේදී විධිමත් ක්‍රමවේද අනුගමනය නොකිරීම හා නව තාක්ෂණය භාවිතා නොකිරීම. (නුවරඑළිය වැනි ඉහළ කඳුකර පළාත්වල සිට ගෙනෙන එළවළු ආර්ථික මධ්‍යස්ථාන වලට පැමිණෙන විට බොහොමයක් විනාශයට ලක්වී තිබීම.)

- අත්‍යවශ්‍ය ආහාර සඳහා සහතික මිලක් නොමැති වීම. - සීනි, හාල්, පරිප්පු, කිරිපිටි සඳහා සහතික මිලක් නිකුත් නොකිරීම සහ ගබඩාවල සඟවා ගනිමින් පාරිභෝගිකයන්ට අලෙවි නොකිරීම නිසා වෙළෙඳපොළේ භාණ්ඩ හිඟයක් ඇතිවීම හා කළුකඩ මිලට අලෙවි වීම් වැඩි වීම.

- ආහාර සුරක්ෂිතතාවයට අදාළ ප්‍රතිපත්ති තීරණ නිසි ලෙස ක්‍රියාවට නොගැනීම හා තීරණ ගැනීමේ දුර්වලතා - රසායනික පොහොර ගෙන්වීම නතර කිරීමත්, ක්‍රමවත් වූ කාබනික පොහොර ව්‍යාපෘති ක්‍රියාවට නොගැනීමත් නිසා කෘෂි බෝග ගණනාවක ඵලදාව අඩු වීම.

Sabaragamuwa University of Sri Lanka

IV. මුළු ජනගහනය තුළ අවුරුදු 60ට හා ඊට වැඩි ජනගහනයෙහි අනුපාතය අඛණ්ඩව ඉහළ යාම ජනගහනය වියපත් වීම ලෙස අදහස් වේ.

- රාජය මූල්‍ය කළමනාකරණය මත ඇතිවන පීඩනය ඉහළ යාම.
  සෞඛ්‍ය පහසුකම් හා සමාජ ආරක්ෂණ අරමුදල (විශ්‍රාම වැටුප්) වෙනුවෙන් රජයේ වියදම් ඉහළ යාම හා වියපත් වූවන්ගෙන් අයකර ගත හැකි බදු අඩුවීම නිසා රාජ්‍ය මූල්‍ය මත ඇතිකරන අඛණ්ඩ තෙරපීම වැඩිවීම.
- වැඩිහිටි යැපුම් අනුපාතය ඉහළ යාම.
  වර්තමානයේ කරන ඉපයුම් වැඩිහිටියන් රැකබලා ගැනීම සඳහා යෙදවීම හේතුවෙන් ඔහුගේ ඉතුරුම් හා ආයෝජනය අඩුවීම නිසා අනාගතයේ ජීවන තත්ත්වය හා ආර්ථික සුරක්ෂිතතාවය අසතුටුදායක වීම.
- වියපත් ජනගහනය රැකබලා ගැනීමට කුටුම්භ අසමත්වීම නාගරීකරණය ,නෂ්ටික පවුල් ඒකක බිහිවීම හා ඉහළ යන ජීවන වියදම නිසා වියපත් ජනගහනය රැකබලා ගැනීමට කුටුම්භ අසමත් වීම.
- වියපත් පුරුෂයන්ට සාපේක්ෂව වියපත් ස්ත්‍රීන්ගේ ජීවන තත්ත්වය වැඩි වේගයකින් පිරිහීම .
  වතු අංශයේ ස්ත්‍රීන්ගේ පවතින අඩු අධ්‍යාපනය , අඩු ශ්‍රම හමුදා සහභාගිත්වය , ස්ත්‍රීන්ගේ දේපළ අයිතිවාසිකම් පිළිබඳ පවත්නා නෛතික සංරෝධකය වැනි කරුණු ද මෙයට හේතු වේ.
  එමෙන්ම පුරුෂයන්ගේ ආයු අපේක්ෂාවට වඩා ස්ත්‍රී ආයු අපේක්ෂාව ඉහළ යාම හේතුවෙන් වියපත් ජනගහනය තුළ වැන්දඹු ස්ත්‍රී සංඛ්‍යාව ඉහළ යාම ද මීට හේතු වේ.
- වියපත් ජනගහනය තම වැඩ කළ හැකි වයස්වලදී උපයාගත් ඉතිරි කිරීම් , වියපත් වූ පසු පරිභෝජනයට යොදා ගැනීම නිසා ප්‍රාග්ධන සම්පාදනය ට අහිතකර බලපෑමක් ඇති වේ.
- ශ්‍රම බලකායේ කාර්යක්ෂමතාව අඩු වීම.

10)

I. ආනයනය කරන භාණ්ඩවලට ආදේශන ලෙස දේශීය වෙළෙඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරනවා වෙනුවට විදේශ වෙළෙඳපොළ ඉලක්ක කොට ගෙන තරඟකාරී ව භාණ්ඩ නිෂ්පාදනය කරන කාර්මීකරණ ප්‍රතිපත්ති අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්ති ලෙස අදහස් කරයි. මෙම අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියක ප්‍රධානතම ඉලක්කය වන්නේ ආනයන සීමා කිරීම නොව අපනයන තරඟකාරීත්වය හා අපනයන විවිධාංගීකරණය මගින් ලෝක වෙළෙඳපොළ තුළ සිය කොටස පුළුල් කර ගැනීම ය.

අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ පහත පරිදි දැක්විය හැකිය.

- විවෘත ආර්ථික ප්‍රතිපත්තිය අනුබලයක් ලෙස ක්‍රියාත්මක වූ ආර්ථික ප්‍රතිපත්තියකි.
- නිදහස් වෙළෙඳාමට ඉඩ ලැබෙන පරිදි ආනයන හා අපනයන සීමා ඉවත් කිරීම.
- විදේශී විනිමය සීමා ඉවත් කිරීම.
- ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක් ඇති කිරීම.
- විදේශ විනිමය රට තුළට ගලා එන පරිදි පැවති විනිමය අනුපාතය 100% ක් අවප්‍රමාණය කිරීම.
- විදේශ විනිමය වෙළෙඳපොළ ක්‍රියාකාරකම් ලිහිල් කිරීම, විදේශ බැංකු හා මූල්‍ය ආයතනවලට රට තුළට පැමිණීමට ඉඩ හසර ලබා දීම.
- ආනයන තීරු බදු ඉවත් කිරීම හා ආනයන තීරු බදු ලිහිල් කිරීම.
- අපනයනය සඳහා පැවති රාජ්‍ය ඒකාධිකාරය අහෝසි කොට තරඟකාරීව අපනයනයට අවස්ථාව ලබා දීම.

II.

- සේවා වියුක්ති අනුපාතය පහළ යාමට ඉවහල් වීම.
- පුද්ගලයන්ගේ ආදායම ඉහළ යාම.
- දරිද්‍රතාව පහළ යාම.
- කුටුම්බ ඉතුරුම් වැඩි වී කුඩා ව්‍යවසායන් වර්ධනය වීම.
- විදේශ ඉපයීම් වර්ධනය වීම.
- ගෙවුම් ශේෂ ගැටලුවලට ප්‍රබල විසඳුමක් වීම.
- විදේශ වත්කම් ශක්තිමත් වීම.
- මුදලේ විදේශ අගය ඉහළ යාම.

Sabaragamuwa University of Sri Lanka

- දේශීය ශ්‍රම වෙළඳපොළේ පුහුණු ශ්‍රම හිඟයක් ඇති වීම හා වැටුප් මට්ටම් ඉහළ යාම.
- පුහුණු ශ්‍රමය විදේශගත වන විට සම්පත් සම්භාරය සංකෝචනය වීම.
- ගෘහ සේවය සඳහා කාන්තාවන් සංක්‍රමණය වීම සමාජ ගැටලුවලට හා දරුවන් හුදෙකලා වීම හා අනාරක්ෂිත වීමට හේතු වීම.

III. සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකා ආර්ථිකයේ කොඳු නාරටිය වන අතර එය තුන්වන විශාලතම විදේශ විනිමය මූලාශ්‍රය වේ. එය රජයට වැදගත් සුවිශේෂී විදේශ විනිමය මූලාශ්‍රයකි. එසේම සංචාරක කර්මාන්තයේ යහපත් බලපෑම නිසා ආර්ථිකමය වශයෙන් ඉහළ වර්ධනයක් ළඟා කරගැනීමට උපකාරී වේ.

පළමුව 2019 පාස්කු බෝම්බ ප්‍රහාර, පසුව 2020 දී COVID-19 වසංගතය සහ වර්තමානයේ පවතින විශාල ආර්ථික අර්බුදය නිසා පසුගිය වසර තුන තුළ ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයට විශාල බලපෑමක් එල්ල වී ඇත. 2021 මහ බැංකුවේ වාර්ෂික වාර්තාවට අනුව, සංචාරක පැමිණීම් 2020 දී 507,704 ට සාපේක්ෂව 2021 දී 194,495 දක්වා සියයට 61.7 කින් අඩු විය.

වර්තමානය වන විට සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග පහත පරිදි දැක්විය හැකිය.

- යටිතල පහසුකම් නොමැතිකම.
- පුහුණු ශ්‍රමයේ අවශ්‍යතාවය සහ ශ්‍රම සංක්‍රමණය.
- රුපියලේ අගය අවප්‍රමාණය වීම.
- නව්‍යතා නොමැතිකම.
- ශ්‍රී ලංකාවේ පවතින අධික උද්ධමනය.
- ආරක්ෂක හේතූන්.
- අපේක්ෂිත සංචාරක වර්ධනයට සාපේක්ෂව හෝටල් කාමර ප්‍රමාණවත් නොවීම.

IV.

- විදේශ විනිමය උපාය ගැනීම සඳහා අපනයන දිරිගැන්වීම. - දේශීය නිෂ්පාදිත දිරිගැන්වීම සහ නව නිෂ්පාදිත වෙළඳපොළට හඳුන්වා දෙමින් භාණ්ඩ හා සේවා අපනයන සඳහා ඉඩ හසර පුළුල් කිරීම.
- ණය ආධාර ලබාගැනීම සහා ඒවා නිවැරදිව හැසිරවීම. - උදා: IMF, World Bank
- කුඩා පරිමාණ ව්‍යාපාරවල නිෂ්පාදන දාම පුළුල් කිරීමට කටයුතු කිරීම.
- අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා පුළුල් කිරීම සහ ඒවායේ කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය, සහය සේවා වැඩිදියුණු කිරීම.
- නිවැරදිව රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා කටයුතු සකස් කිරීම.
- දූෂණය සහ මූල්‍ය වංචා වලින් තොර පාලනයක් ගෙනයාම.
- ආර්ථිකය සංවර්ධනයට දායක වන ක්ෂේත්‍ර ගොඩනැංවීමට සහාය ලබා දීම. - උදා: සංචාරක කර්මාන්තය, ඇඟලුම් කර්මාන්තය.

Sabaragamuwa University of Sri Lanka